www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# බුෂ්ගේ පකිස්ථාන සංචාරය මුෂාරෆ්ගේ අර්බුදය තීව්‍ර කරනු ඇත

## Bush visit to Pakistan will intensify Musharraf's crisis

**පීටර් සිමන්ඩ්ස් විසිනි**
**2006 මාර්තු 4**

දැවැන්ත ආරක්ෂක පියවරයන් සහ රට පුරා නගරවල එක්සත් ජනපද විරෝධී විරෝධතා මාලාවක් මධ්‍යයේ ඊයේ රාත්‍රියෙහි එක්සත් ජනපද ජනාධිපති ජෝර්ජ් බුෂ් පකිස්ථානයට පැමිනියේ ය. එක් දින සංචාරයේ ප්‍රධාන අරමුන ජනාධිපති පර්වේස් මුෂාරෆ්ගේ අඩමාන තන්ත්‍රයට මුක්කු ගැසීම නමුදු, පකිස්ථානයේ මිලිටරි බලවතා මුහුන දී සිටින ප්‍රචන්ඩ දේශපාලන කැලඹීම්වලින් වැඩි කොටසකට බුෂ් පරිපාලනය සෘජුව ම වගකිව යුතු ය.

වොෂින්ටනය විසින් බල කරනු ලැබීම මගින් 2001 දී මුදා හැරුන එහි ''ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයට සහාය දීම සහ අසල්වැසි ඇෆ්ඝනිස්ථානයේ පාලන තන්ත්‍රය පෙරලා දැමීමට උපකාර කිරීම නිසා මුෂාරෆ් එක්සත් ජනපද ගුන්ඩෙකු ලෙස පකිස්ථාන ජනතාවගේ පලල් ස්තරයන් විසින් දකිනු ලබයි. යුරෝපා සහ එක්සත් ජනපද ප්‍රවෘත්තිපත්‍රවල පල වූ මුස්ලිම් විරෝධී කාටූනවලට විරෝධය පෑම සඳහා පසු ගිය මාසය පුරා ම දසදහස් ගනන් ජනයා වීදි බැස්සාහ. එක්සත් ජනපදයට ගැති වීම මෙන් ම දසලක්ෂ සංඛ්‍යාත පකිස්ථාන මහජනතාව මුහුන දෙන ආර්ථික සහ සමාජ අර්බුදයට ආමන්ත්‍රනය කිරීමට අසමත් වීම කෙරෙහි ද විරෝධතාකරුවෝ සිය කෝපය ප්‍රදර්ශනය කලහ.

පකිස්ථානයේ නගර ගනනාවක ඊයේ බුෂ් විරෝධී පෙලපාලි පැවැත්වුන අතර විරුද්ධ කන්ඩායම් විසින් ''කලු දිනයක්'' ලෙස නම් කර ඇති අද දින තවත් පෙලපාලි සැලසුම් කර තිබේ. බුෂ් ගොඩ බට රාවල්පින්ඩි ගුවන් කඳවුර අසල ''මිනීමරුවා ආපසු යනු'' සහ ''ඇමරිකාවට මරනය'' යන සටන් පාඨ හඬ නගමින් සිටි දහසක් පමන ජනයා විසුරුවා හැරීමට පොලීසිය බැටන් ප්‍රහාර එල්ල කලේ ය. දහසක් පමන වූ විරෝධතාකරුවෝ ස්වයංනාශක බෝම්බකරුවෙකු විසින් බ්‍රහස්පතින්දා එක්සත් ජනපද නිලධාරියෙකු සහ තවත් තිදෙනෙකු ඝාතනය කෙරුනු පකිස්ථානයේ දකුනු ප්‍රදේශයේ කරච්චි නගරයේ පිහිටි ඇමරිකානු කොන්සියුලර් කාර්යාලයට පා ගමනක් යාමට උත්සාහ කලහ.

බුෂ්ගේ සංචාරයේ අරමුන වූයේ ''පකිස්ථාන ජාතිය වහල් භාවයට පත් කිරීම'' සහ ''ඔහු ඇමරිකානු දේශප්‍රේමීත්වයට ජෙනරාල් මුෂාරෆ්ට තෑගි දීම'' බව දසදහසක් පමන සහභාගි වූ මුල්තානයේ පැවති විශාලතම රැලිය අමතමින් මුස්ලිම් පූජකයෙක් පැවසී ය. මුෂාරෆ් මුහුන දී සිටින දේශපාලන අර්බුදයෙන් ගොඩ එනවා වෙනුවට අසල්වැසි ඇෆ්ඝනිස්ථානය තුලට එක්සත් ජනපද විරෝධී කැරලිකරුවන් විනිවිදීම වැලැක්වීම සඳහා ඔහු තව තවත් පියවර ගත යුතු යැයි යන ඉල්ලීම නිසා බුෂ්ගේ සංචාරය මගින් එය වඩාත් තීව්‍ර කරනු ඇත. වොෂින්ටනයේ බල කිරීම මත තැලිබාන් සහ අල්කයිඩා සටන්කරුවන් දඩයම් කිරීම සඳහා ඇෆ්ඝනිස්ථාන දේශ සීමාව අසල ගෝත්‍රික ප්‍රදේශවලට පකිස්ථාන මිලිටරිය 70,000ක් පමන භට කන්ඩායම් දැනට මත් යවා ඇත. මෙම මර්දනකාරී මෙහෙයුම් සහ එක්සත් ජනපද හමුදාවන් විසින් පකිස්ථානය තුල කරනු ලබන රහසිගත පහර දීම් නිසා මුෂාරෆ් කෙරෙහි පෘථුල අප්‍රසාදයක් සහ වෛරයක් ජනනය වී තිබේ.

පෙබරවාරි 22 දා *ඒෂියා ටයිම්ස්* වෙබ් අඩවියේ ''මුෂාරෆ් ඔහුගේ ග්‍රහනය අහිමි කර ගනියි'' යන සිරස්තලය සහිතව පල කෙරුනු ලිපියක මෙසේ සඳහන් විය: ''බස්නාහිර දේශ සීමා පලාතේ ගෝත්‍රික ප්‍රදේශ තුල, එනම් තැලිබාන් පරිපාලනයක් පවතින දකුනු සහ උතුරු වසිරිස්ථානයේ (ඉස්ලාමාබාද්) පරිපාලනයේ බලපෑම දැනට මත් දුබල වී ඇති අතර පකිස්ථාන හමුදාවලට වනා සහ මිරන්ෂහා දිස්ත්‍රික්ක මූලස්ථානවලින් පිටතට යා නොහැකි ය. වර්තමානයේ පාලනය ගෙන යන කැරලිකරුවන් මත සන්නද්ධ හමුදාවල අයෝමය ග්‍රහනය නැති වීමත් සමග බලූකිස්ථාන පලාත හමුදාවට ගොඩ ඒ ගත නොහැකි මඩගොහොරුවක් බවට පත්ව ඇත. දිනපතා ම වාගේ, භයංකර ප්‍රතිරෝධය විසින් සම්පත් බහුල කලාපයේ ගෑස් නල මාර්ග සහ විදුලිබල මාර්ග පුපුරුවා හරින නමුත් පකිස්ථාන හමුදාවන්ට කල හැකි දේ සොච්චමකි.''

මුෂාරෆ් කැරලිකරුවන් විනිවිදීම වලක්වන්නේ නැතැයි යන චෝදනාවලට ප්‍රතිචාර වසයෙන් කාබුල් පාලනය බලූකිස්ථාන කැරැල්ලට උදව් කරන බවට ඉස්ලාමාබාදය චෝදනා කර ඇත. බුෂ් සමග ප්‍රශ්නය සාකච්ඡා කරන බව පකිස්ථාන දේශීය ඇමති ඇෆ්ටාබ් ඛාන් ෂේර්පාවෝ ඊයේ පැවසී ය. "බලූකිස්ථානයේ සහ කරච්චියේ සෑම ත්‍රස්තවාදියෙකුට ම සැඟවුන විදේශ හස්තයක් සම්බන්ධ වී ඇතැ" යි ඇෆ්ඝනිස්ථානය ගැන විශේෂයෙන් සඳහන් කිරීමකින් තොරව ඔහු ප්‍රකාශ කලේ ය.

එබඳු ආයාචනවලට බුෂ්ගෙන් කෙටි පව් සමා කිරීමක් ලැබීමට ඇතැම් විට ඉඩ ඇත. සම්පත් බහුල මැද පෙරදිග සහ මධ්‍යම ආසියාව තුල ආධිපත්‍යය තබා ගැනීමේ එක්සත් ජනපද අභිලාෂයට සහාය ලබා ගැනීමේ දී, විශේෂයෙන් ම ඇෆ්ඝනිස්ථානය තුල එක්සත් ජනපද වාඩි ලා ගැනීමට උපකාර ලබා ගැනීමේ දී මුෂාරෆ් තම ප්‍රධාන සහායකයෙකු ලෙස බුෂ් පරිපාලනය සලකයි. මුෂාරෆ්ට දේශපාලනිකව සහයෝගය දීමට සහ කරනු ලබන සේවාවන්ට ගෙවීමේ දී ආර්ථික උපකාර සැපයීමට එය සූදානම් ය. නමුත් කලාපීය බලයක් ලෙස එක්සත් ජනපදය සලකන පකිස්ථානයේ පසමිතුරු ඉන්දියාව සමග සමීප මූලෝපායාත්මක සහ ආර්ථික සන්ධානයක් තහවුරු කර ගැනීමට වොෂින්ටනය වඩාත් කැමති ය. වොෂින්ටනයේ අනුග්‍රහය මත දිගට ම යැපිය යුතු බව ඔහුගේ පැත්තෙන් මුෂාරෆ් හොඳින් ම දන්නේ ය. උතුරු වසිරිස්ථානයේ මිලිටරි මෙහෙයුම්වල දී වැඩි පිරිස ''විදේශිකයන්'' වූ සටන්කාමීන් 45 දෙනෙකුට වඩා ඝාතනය කල බව නිවේදනය කරමින් පකිස්ථාන හමුදාව අර්ථභාරී ලෙස බුෂ්ගේ පැමිනීමට ආසන්නව බදාදා ප්‍රකාශයක් නිකුත් කලේ ය. එක්සත් ජනපදය විසින් මෙහෙයවන ''ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයේ දී'' පකිස්ථානය එහි කොටස ඉටු කිරීම සම්බන්ධ සාක්ෂ්‍යයක් ලෙස පකිස්ථානු ජනාධිපති විසින් ප්‍රවෘත්තිය උපුටා දක්වන බව නිසැක ය.

කෙසේ නමුත් මුෂාරෆ්ට වැඩිමනත් දෙයක් ආ පස්සට බලාපොරොත්තු විය නොහැකි ය. මුෂාරෆ් පාලන තන්ත්‍රයට සහ ප්‍රජාතන්ත්‍රවාදය දෙසට ගනු ලබන එහි ඊනියා පියවර සම්බන්ධ මුලුමනින් ම කුහක ප්‍රකාශවලට බුෂ් ඔහුගේ ප්‍රසිද්ධ සහාය ලබා දෙනු ඇත. පකිස්ථානය තුල වර්ධනය වන දේශපාලන අර්බුදය මධ්‍යයේ මුෂාරෆ්ගේ රාජ්‍ය නිලධරය සහ මිලිටරි ගැති පකිස්ථාන මුස්ලිම් ලීගය (ක්‍යු) 2007ට නියමිත ඡන්දය කල් දමන බවට ඇඟවුම් කර තිබේ. ජනාධිපති සහ සන්නද්ධ හමුදාවල ප්‍රධානියා ලෙස -- ඔහුට පුලුල් ආඥාදායක බලතල ලබා දෙන තනතුරු -- මුෂාරෆ් බලයේ රැඳී සිටිනු ඇති බවට ද අදහස් පල කෙරී ඇත.

වෙලඳාම සහ ආයෝජන ශක්තිමත් කිරීම සඳහා බුෂ් සහ මුෂාරෆ් විසින් ද්විපාර්ශ්වීය ගිවිසුමක් අත්සන් කිරීමට නියමිත ය. ඩොලර් බිලියනයක මිලිටරි ආධාර ඇතුලුව 2002 සහ 2005 අතරතුර ඩොලර් බිලියන තුනක පමන සෘජු ආධාර ලබා ගනිමින් එක්සත් ජනපදයේ ආධාර ලබන ප්‍රධාන රටවලින් එකක් බවට 2001 සිට පකිස්ථානය පත්ව තිබේ. පකිස්ථානයේ ත්‍රස්ත විරෝධී මෙහෙයුම් සඳහා කරනු ලබන ''ප්‍රතිපූර්න ගෙවීම්''වල ස්වරූපයෙන් අතිරේක ආධාර ලබා දී ඇත.

## ඉන්දියාව වෙත හැරීම සම්බන්ධ ආතතිය

එක්සත් ජනපදය සමග පවතින වර්තමාන සම්බන්ධතා එහි උත්සුකතාවන් වෙනස් වූ විට ඉවත දමනු ලබන හුදෙක් ම වොෂින්ටනයේ කෙටි කාලීන පහසුව සම්බන්ධ කාරනයක් බවට ලඝු කරමින් පකිස්ථාන පාලක කවයන් තුල පවතින භීතිය අස්වැසීමට බුෂ් නිශ්චිතව ම උත්සාහ කරනු ඇත. ඉස්ලාමාබාද් සමග දිගු කාලීන සම්බන්ධතා අවශ්‍ය බව බුෂ් පරිපාලනය යලි යලිත් ප්‍රකාශ කර ඇති අතර එය මනාව මිලිටරි සහයෝගය ගුනාංගීකරනය කරමින් පකිස්ථානය ''නේටෝ නොවන ප්‍රධාන සහායකයෙකු'' ලෙස නම් කර තිබේ. පකිස්ථානය ''තවත් වැදගත් පාර්ශ්වකරුවෙකු සහ මිත්‍රයෙකු'' ලෙස බ්‍රහස්පතින්දා නව දිල්ලියේ දී කල සමු ගැනීමේ කථාවක දී බුෂ් ප්‍රකාශ කලේ ය. පැහැදිලි ඉන්දියානු හිතවත් නැම්යාව ගැන ඉස්ලාමාබාද්හි උත්සුකතාවන් මෙමගින් නො සන්සිඳෙනු ඇත. පකිස්ථානයේ නොරිස්සුමට විශේෂයෙන් තුඩු දී ඇත්තේ බදාදා නිවේදනය කල එක්සත් ජනපදය සහ ඉන්දියාව අතර න්‍යෂ්ටික ගිවිසුම ය. අවසාන වසයෙන් එක්සත් ජනපද කොන්ග්‍රසය විසින් අනුමත කර ක්‍රියාවේ යෙදවුනොත් පිලිගත් න්‍යෂ්ටික සන්නද්ධ බලයක තත්වයට ඉන්දියාව ඉහලට නැගෙනු ඇත. එහි සිවිල් න්‍යෂ්ටික වැඩ පිලිවෙල සඳහා ජාත්‍යන්තර පරමානු බලශක්ති ආයතනයේ නියමය පිලිගැනීමට ප්‍රතිචාර වශයෙන් න්‍යෂ්ටික අවිහරන ගිවිසුමට අත්සන් නො කර ම හෝ එහි මිලිටරි න්‍යෂ්ටික වැඩ පිලිවෙල අත නො හැර න්‍යෂ්ටික ඉන්ධන සහ තාක්ෂනය ලබා ගැනීමේ අවස්ථාව ඉන්දියාවට හිමි වෙයි. ගිවිසුම ඉන්දියාවට ද්‍රව්‍යමය වසයෙන් උපකාර වනවා පමනක් නො ව, කලාපීය බලයක් ලෙස එහි නැගී සිටීම ශක්තිමත් කරනු ද ඇත.

මුෂාරෆ් බුෂ්ගෙන් ඒ හා සමාන ගිවිසුමක් ඉල්ලා සිටිනු ඇත. නමුත් නිශ්චිතව ම ප්‍රතික්ෂේප කරනු ඇත. ''ප්‍රගුනන උත්සුකතාවන්'' -- නිසා පකිස්ථානයේ දක්ෂතම න්‍යෂ්ටික විද්‍යාඥ ඒ. ක්‍යු. ඛාන් විසින් ඉරානයට, ලිබියාවට සහ උතුරු කොරියාවට රහසිගතව න්‍යෂ්ටික තාක්ෂනය විකිනීම ගැන සඳහනක් -- දැනට පකිස්ථානය සමග න්‍යෂ්ටික ගිවිසුමක් අත්සන් කල නොහැකි බව එක්සත් ජනපද රාජ්‍ය ලේකම්

කොන්ඩලීසා රයිස් බ්‍රහස්පතින්දා මාධ්‍යවලට ප්‍රකාශ කලා ය. එක්සත් ජනපද ආස්ථානය අගතිගාමී සහ පකිස්ථානයට වඩා ඉන්දියාව සමග එහි සම්බන්ධතා කෙරෙහි වැඩි බරක් එක්සත් ජනපදය විසින් යොදන බවට එය තව දුරටත් සාක්ෂ්‍යයක් යැයි ඉස්ලාමාබාද්හි පවතින හැඟීම් මෙම ප්‍රකාශයන් මගින් සමහන් නො වනු ඇත. කාශ්මීරය සම්බන්ධයෙන් සහන සැලසීම සඳහා ඉන්දියාව තල්ලු කරන ලෙස ඇතැම් විට පකිස්ථාන ජනාධිපති ද බුෂ්ගෙන් ඉල්ලා සිටීමට ඉඩ තිබේ. කාශ්මීරය තුල ඊනියා සාම ක්‍රියාවලිය කෙරී ගෙන යන නමුදු දශක ගනනාවක සතුරුකම්, ආතතිය සහ රටවල් දෙක අතර යුද්ධය කෙලවර කිරීම සඳහා ගෙන ඇත්තේ සාටෝපකාරී පියවරයන් පමනි. පසු ගිය ඔක්තෝබර් මාසයේ දී කාශ්මීරයේ ඇති වූ විනාශකාරී භූමිකම්පාවෙන් පසුව සහයෝගයක් නැතිකම පවතින ආතතීන් සම්බන්ධ වඩාත් මෑත ම ප්‍රකාශනය යි. වොෂින්ටනයේ මැදිහත් වීමක් නැති වුනොත් කාශ්මීරය සම්බන්ධ කවර හෝ එකඟතාවක් ඇති කර ගැනීමේ ශක්‍යතාව නැති කරමින් රටවල් දෙක අතර සම්බන්ධතා තව දුරටත් නරක අතට හැරීම පමනක් සිදු වනු ඇතැයි පකිස්ථානය සිටින්නේ බියෙනි.

කෙසේ වුව ද, අන්‍යොන්‍ය විශ්වාසය සහ සාමය සම්බන්ධ හිස් ආයාචනයන්ට අමතරව කාශ්මීරය සම්බන්ධයෙන් බුෂ් මුෂාරෆ්ට කවර හෝ සහයෝගයක් දීමට ඉඩ ඇති බවක් පෙනෙන්නට නැත. ''දේශ සීමා හරහා ත්‍රස්තවාදය'' සම්බන්ධ ප්‍රශ්නය ඔහු මුෂාරෆ් සමග මතු කරන බව ඇත්ත වශයෙන් ම එක්සත් ජනපද ජනාධිපති ඉන්දියාවට පොරොන්දු වී තිබේ. ජම්මු සහ කාශ්මීරය ඉන්දියාව විසින් පාලනය කරනු ලැබීමට විරුද්ධ ඉස්ලාමීය මූලධර්මවාදී සටන්කරුවන් පාලනය කිරීමට සැලකිය යුතු පියවර ගෙන තිබෙන පකිස්ථානය සම්බන්ධයෙන් ගත් කල එය වොෂින්ටනයේ ඉන්දියාවට පක්ෂපාතී නැඹුරුව ගැන තවත් සලකුනකි.

ඉරානයට එරෙහි එක්සත් ජනපදයේ ආක්‍රමනශීලී ආස්ථානයට පකිස්ථානය සහාය දීම අවධාරනය කිරීමට සහ ඉස්ලාමාබාදය මෙන් ම නව දිල්ලිය ඉරානයේ සිට පකිස්ථානය හරහා ඉන්දියාවට එලීමට සැලසුම් කර ඇති බහුමිලියන ගෑස් නල මාර්ගය අත හැරීමේ එක්සත් ජනපද ඉල්ලීම යලි මතු කිරීමට ද බුෂ් බලාපොරොත්තු වෙයි. මෙම ව්‍යාපෘතිය අහෝසි කිරීම රටවල් දෙකට ම එල්ල කෙරෙන පහරකි. පකිස්ථානය නල මාර්ගය දෙස බැලුවේ, බලශක්තිය සැපයීමේ සහ වඩාත් අවශ්‍ය කරනු ලබන ආර්ථික වැඩි දියුනුවක් සහ ඉන්දියාව සමග සාකච්ඡාවල දී යොදා ගත හැකි වැදගත් කාඩ් එකක් ලෙස ය.

මෙම නොවිසඳුනු ගැටලු එක්සත් ජනපදය-පකිස්ථානය තුල පවතින ආතතිය ඉස්මතු කර පෙන්වයි. පකිස්ථානයේ සිවිල් න්‍යෂ්ටික වැඩ පිලිවෙල ප්‍රසාරනය කිරීමට චීනයේ සහයෝගය ලබා ගැනීමේ ඔහුගේ උත්සාහයේ කොටසක් ලෙස බුෂ්ගේ සංචාරයට සති දෙකකට පෙරාතුව මුෂාරෆ් බෙයිජිනයට කල අතිශයින් කැපී පෙනෙන සංචාරය මෙහි දී සටහන් කිරීම වැදගත් ය. සංචාරය තුල දී, පකිස්ථාන ජනාධිපති ගිවිසුම් 13ක් සහ බලශක්තිය, ආරක්ෂාව, වෙලඳාම සහ සන්නිවේදනය ආවරනය වන අවබෝධතා ගිවිසුමක් අත්සන් කලේ ය. චීනය පකිස්ථානයේ ප්‍රධාන මිලිටරි සැපයුම්කරුවෙකු වන අතර රටවල් දෙක අතර පෘථුල ආර්ථික සම්බන්ධතා තිබේ. බලුකිස්ථානයේ ග්වාන්දාරයේ ප්‍රධාන වරායක් ගොඩ නැඟීමේ වැඩ කටයුතුවලට චීනය මැදිහත් වී සිටී.

මුෂාරෆ්ගේ චීන සංචාරයට කල් නියම කිරීම අහම්බයක් නො වී ය. බෙයිජිනය සමග සම්බන්ධතා ශක්තිමත් කර ගැනීම මෙන් ම, සංචාරය අනෙක් අතට වොෂින්ටනයට පැහැදිලි පනිවුඩයක් යැවී ය: පකිස්ථානය සමග එහි සන්ධානය පහත් මට්ටමකට දැමීමට හෝ අත හැර දැමීමට එක්සත් ජනපදය තීරනය කලොත් චීනය සමග සමීප සම්බන්ධතා තහවුරු කර ගැනීමේ මනාපය ඉස්ලාමාබාදයට ඇත.

දැනට මුෂාරෆ් එක්සත් ජනපදයට බැඳී සිටියත්, එහි දිගු කාලීන චීන විරෝධී මූලෝපායෙහි ප්‍රධාන මූලයක් ලෙස ඉන්දියාව දිනා ගැනීමට බුෂ් පරිපාලනයේ උත්සාහයට නිශ්චිත දේශපාලන තර්කනයක් තිබේ. එහි ගනන් බැලීම් නො තකා නව දිල්ලියට වොෂින්ටනයේ සහාය දීම මගින් දකුනු ආසියාව තුල බලවේග අතර කලින් පැවති අඩමාන පාලනය වෙනස් කරමින් සහ චීනය සමග සම්බන්ධතා තව දුරටත් පෙරට ගෙන යාමට පකිස්ථානයට වඩ වඩා බල කරමින් කලාපීය බලයක් ලෙස ඉන්දියාවේ තත්වය අනිවාර්යයෙන් ම ශක්තිමත් කෙරෙනු ඇත.

විසිඑක් වන සියවසේ මුල් සමයේ දී ප්‍රධාන භූ-දේශපාලනමය විභේදනරේඛාව ලෙස හැඩ ගැසෙමින් පවතින්නා වූ දෙය එනම් එක්සත් ජනපදය සහ චීනය අතර පුපුරා යාමේ විභවයක් පවතින්නා වූ මහා සට්ටනය සමග ඉන්දියාව සහ පකිස්ථානය අතර දිග් ගැස්සුන සහ කටුක ගැටුම වෙලීපැටලී යාමේ හැකියාව මේ සමග ඉස්මත්තට එයි.